කවි කොළය

හිනාවෙන පොල්බෑය අපායට යයි

පසුගිය දිනක යමපල්ලන් සියළු දෙනා
එක්වී දෑත් බැඳ රුකවල් ඇතිව මනා
පවිකාරයෙක් යම රජු ඉදිරියට ගෙනා
පොල් බෑයක් වගේ කට ඇර සිනහ වුණා

“ තා කවරෙක්ද දක්වන මේ කිඹුල් කට ”
යම රජු ඇසී ඔහු දැක මරු ජුවල් පිට
“ ජීවිත දහස් ගණනක් රට අවුල් කොට
යැවිවේ මමයි සාමිනි මරු තුරුල් ලට”

යම රජු බලයි ගොස් ඇස් දෙක උඩු කුරුව
කවරෙද තගේ නම පවසව මිනි මරුව
පිරිබාහරන් ළඟ පක්කලිකම් කෙරුව
මම වෙමි තමිල් වෙල්වම් නම් මහ බොරුව

බාබර සැලුනයක මම කැපුවෙමි කොණ්ඩ
ඉන්පසු පටන්ගෙන සෙල්ලම වෙඩි උණ්ඩ
සටනෙදි කැබලි වුණ පසු මගෙ වම් අංඩ
ගත්තෙමි අතට මේ සුදු සැරයට් දණ්ඩ

මවගේ අතින් ඩැහැගෙන කැපුවෙමි දරුවා
සඟ සැට නමක් මතකයි කැති ගා මැරුවා
කොබ්බෑකඩුව සහ පාරම් රණ විරුවා
මරමින් ලොවට සාමය ගැන උඩු බිරුවා

ජයසිරි මහා බෝධිය ළඟ දෙදණ නවා
සිටි ඒ අහිංසකයන් පරලොවට යවා
හැරියෙමි පුපරවා දළදා මැදුර පවා
එමගින් ගතිමි තිරිසන් ලේ පවස නිවා

කුඩු පට්ටම් කළෙමි මහ බැංකු යෝද
මැරුවා දෙසිය ගණනක් පිට කොටු වේද
හැලූ ලේ කඳුළු කඳ පරයයි මහ මුද
මේවා තමා මා කළ මහ අප රාද

දන්නෙද කදිරගාමර් කවුරුද මැරුවේ
තිරුවෙල්වම්ගෙ ලේ රස කර කර ඉරුවේ
යෙදෙමින් සාම සාකච්ඡා නම් බොරුවේ
යුද අවි ගෙනෙන්නයි රට රට සැරි සැරුවේ

ඉන්දිය අග ඇමති ජනපති ඇමති වරු
ගාමිණී දිසානායක වැනි පිරිස ගරු
සමගින් දහස් ගණනක් ඝාතනය කෙරු
මම වෙමි ගහලයා මම වෙමි වරද කරු

කී විට ඔහුගෙ කෙරුවාවල් තෙපර බබා
යම රජු තින්දුව දුන්නා ඔහුට ලබා
මොහුගේ කටට උණු ලෝදිය අඟුරු ඔබා
වද දෙනු කල්ප දහසක් අව්චියෙහි තබා

යමරජු තින්දුව එළි
දක්වන විටම
ඔහු පැවසුවේ කරුණකි
කළඹන රටම
දඬුවම් කරන්නේ ඇයි
තනිකර මටම?
ලොක්කත් මෙහේ එනවා
ඇත අද හෙටම!

♦ **තලන්ගම ජයසිංහ**
Sri Lanka

තලන්ගම කිවිඳුන්ටයි මේ උපහාරය!

ලක්විති පත්තරේ ගත් හැටියෙම අතට
මගෙ හිත දුවයි කවි කොළයට පළමු කොට
සිනහව ඉතිරී පැතිරී යයි දස දෙසට
ඔබ නැති කලෙක කොතරම් පාළු ද රටට

වාහන සුනාමිය ටියුෂන් කඩ වලට
සුබවාදීව ඔබ දිටි තතු ඇති ලෙසට
මේ වැනි අමිල අදහස් එන්නේ කාට
අපි ණයගැතියි ඔබ වැනි ලක් පුතුන් හට

ලක් විති කතුතුමා සහ ඔබ රැක ගන්න
තෙරුවන් සරණ ලැබ දිගු කල් වැජඹෙන්න
මේ පත බලන හැමගේ සිත් සනසන්න
රන්මය නව අරුත් ගෙන පෙරටම එන්න

♦ **එස්. කංකානම්ගේ**
London SW 2

Letters to the Editor කතෘට ලියුම්

අනේ! මේ බෞද්ධයින්ද?

පහුගිය සුමානෙ මම ගියා ලන්ඩන්වල ලංකාවෙ පන්සලකට මිත්‍රයෙකුගෙ ආරාධනාවක් ලැබිලා පිංකමකට සහභාගි වෙන්න. මම සාමාන්‍යයෙන් මේ පන්සලට යන්නෙ නැහැ. මොකද ඒක මිනිස්සු එකතුවෙලා කතාකරන තැනක් මිසක්, පන්සලක් හැටියට මට දැනිල නැති නිසා.

එදා හාමුදුරුවො ඔක්කොම පූජා ගාථා ආදිය කියවලා ඉවරවෙලා කියනවා, “ අපි මේ කරගත්ත පින් වලින් අපට තියෙන කරදරවලින් මිදෙන්න ලැබේවා! ” කියලා. මට හැතෙන හැටියට ඒකෙ වැරැද්දක් නැහැ. අපි කවුරුත් කැමතියි අපට තියෙන කරදර වලින් මිදෙන්න. බෞද්ධයො හැටියට අපේ ප්‍රධාන ආගමික පරමාර්ථය තමයි දුකින් මිදීම. අපි එක එක්කෙනා මේ පරමාර්ථය මුදුන් පමුණුවාගන්න එක එක ප්‍රමාණයට උත්සාහ කරනවා. මමත් ඒ අරමුණ සඳහා පුළුවන් තරම් උත්සාහ කරනවා.

හැබැයි හාමුදුරුවෙ කතා කළේ දුකෙන් මිදීම ගැන නොවෙයි. ග්‍රහ අපලවලින් මිදීම ගැනයි. පූජාව ඉවරවෙච්ච ගමන්ම ඔක්කොම ග්‍රහයන්ගෙන් වෙන අපල දුරුවේවා කියලා කවි වගයක් කිව්වා.

මම දන්න බුද්ධාගමේ හැටියට බුදුහාමුදුරුවො ග්‍රහ අපල ගැන කතාකරලා නැහැ. කවුරු හරි කෙනෙක් දන්නව නම් බුදුහාමුදුරුවෝ ග්‍රහයො ගැනයි ග්‍රහඅපල ගැනයි දේශනා කරපු ධර්මයක් ගැන මමත් කැමතියි දැනගන්න. ග්‍රහයො ගැනයි ඒවායෙ තියන බලපෑම් ගැනයි ලියන්න නම් වෙනම ලිපියක් ලියන්න වේවි. මට මෙතනදි ලියන්න අවශ්‍ය අපි බෞද්ධයො හැටියට කරන බොරුව ගැනයි. මේ මම කියපු පන්සලේම ප්‍රධාන කාර්‍යය හැටියට කෙරෙන්නෙ දෙවියන් ඇදහීම. මේ ගැනත් මම වෙනම ම ලියන්න හිතන නිසා වැඩිය ලියන්නෙ නැහැ. මම කැමතියි මගේ අදහස් වලට විරෝධි අදහස් තියෙන අයගේ තර්ක මොනවද කියලා දැනගන්න. හැබැයි මගේ අදහස්වලට විරුද්ධ අදහස් මිසක් මට විරුද්ධව පුද්ගලික විවේචන ලියලා වැඩක් නැහැ. මොකද මට ඒවා දරාගන්න බැරිකම නිසා නෙවෙයි, ඒවා වැඩක් නැති නිසා. මාතෘකාව ගැන විතරක් කතා කරමු.

මේක මේ පන්සලට විරුද්ධව කරන ප්‍රචාරයක්වත් නොවෙයි. එහෙම හිතන්න එපා. මම දන්න විදියට ‘අපි බෞද්ධයෝ’ ය කියාගෙන ඉන්න වැඩිපුරම සිංහලයෝ ග්‍රහඅපල දුරුකරගන්න පූජා පවත්වන අය. පන්සලට ගිහිං දෙවියො අදහන, කෝවිලට ගිහිල්ලා දෙවි පිහිට ඉල්ලලා කන්නලව් කරන, අඩා වැටෙන අය. පොල් ගහන අය. මේ ඔක්කොම ගැන තමයි මම මේ ලියන්නෙ. මේ අයගෙන් සමහර දෙනෙක් අදහන්නෙ බුදුන් නොවෙයි සායිබාබාව.

♦ **කොල්වින් ජයසිංහ** Watford **UK**

The First Theravada Buddhist Centre in Wales
වේල්සයේ ප්‍රථම ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානය

The first Theravada Buddhist Centre was opened on the 30th of June this year on the Welsh borders, about 17 miles south west of Shrewsbury.

The highlight of the opening ceremony was the presence of three monks from the Kanduboda Meditation Centre. Bhante Bodhidharma was a pupil of Ven. Premasiri for 15 years and he was delighted to witness the opening of a Meditation Centre in this country.

The Centre welcomes both beginners and experienced meditators. Further details available on the website. **www.satipanya.org.uk**

මහා බ්‍රිතාන්‍යයේ වේල්ස් ප්‍රාන්ත සීමාවේ පිහිටි ෂ්‍රුස්බරි නගරයට සමීපව විපස්සනා භාවනා මධ්‍යස්ථානයක් පූජ්‍ය බෝධිධර්ම හිමියන්ගේ පාලනය යටතේ ආරම්භ කර තිබේ. ශ්‍රීලංකාවේ සුප්‍රකට කඳුබොඩගම භාවනා මධ්‍යස්ථානයේ හිමිවරුද මෙහි වැඩම කරති. ප්‍රවීනයන්ට මෙන්ම භාවනාවට ආධුනික වූ අයයටද මෙය එකසේ විවෘතය. වැඩි විස්තර සඳහා **www.satipanya.org.uk** වෙබ් අඩවිය පිරික්සන්න.

ඉරිදා SUN - ලංකාවෙ තියන සිරස රේඩියෝවයි, ටෙලිවිෂන් එකයි කොටින්ට පක්ෂය කියලා ලංකාවෙ බොහොම දෙනෙක් කතා වෙනව. ගිය සතියෙ කොටිනායක ප්‍රභාකරන්ගෙ වීර දිනයට ඉස්සරින්දා ලංකා ගුවන් හමුදාව කිලිනොච්චියෙ කැලෑවක අටවල තිබුණු කොටිහඬ ගුවන්විදුලි මධ්‍යස්ථානය විනාස කළා. කොටින්ට ඒක ලොකු පාඩුවක්. ප්‍රභාකරන්ගෙ වීරදිනයෙ පාරම්බෑම මේසැරේ විකාශනය කරන්න බැරිවුණා. ඒත් ඒ පාඩුව පිරිමහන්න ඉදිරිපත්වුණේ සිරස රූපවාහිනියයි ගුවන් විදුලියයි කියලා ආතර්මාමා ලියලා එවලා තියෙනවා. සිරස ප්‍රභාකරන්ගෙ කතාව ප්‍රචාරය කළාලු සිංහලෙන් ඉංග්‍රීසියෙන් දෙමළෙන්. ඒක තනිකරම කොටි ත්‍රස්ත-වාදීන්ට සපෝට් කිරීමක් හැටියටයි මාම දකින්නෙ. ඒ කතාව ඇත්ත. සිරස අයිති මහාරාජලට. තේරෙනව නේද දැන් වැළ යන්නෙ කොයි පැත්තටද කියලා.

සඳුදා MON - දැන් මේ අපි දකින්නෙ ලංකාවෙ මාධ්‍යයේ අන්ත පිරිහීම. එදා එම්. ජේ. පෙරේරලා, තේවිස් ගුරුගේලා, ඩී. ඇම්. කොළඹගේලා, රිජ්වේ තිලකරත්නලා වගේ රේඩියෝවෙ හිටි ප්‍රවීනයො එදා හොබවපු තැන්වල අද ඉන්නෙ තඹ සතේකට වැඩක් නැති ගස් ගෙම්බො. ලංකාවෙ කණට ඇහෙන, ඇහැට දකින ජන මාධ්‍යයෙන් අද දෙන්නේ දහ ජරාව. එච්චරද? දේශයේ සාර ධර්ම විනාස කරනවා. සිරස හා ඒවගේ තවත් මස්ත බාල්දු එප් එම් නාලිකාවලට ප්‍රවෘත්තිවලදි කොටි ත්‍රස්ත වාදීන් මහත්වරු වෙලා පේනවා. ප්‍රභාකරන් මහතා, තමිල් වෙල්වන් මහතා කියලයි කියන්නෙ. ඒ එක්කම රටේ ජනාධිපති නිකම්ම නිකං මහින්ද රාජපක්ෂ. සිංහළ රජකාලෙ නම් මුන්ව දෙකට ඉරනවා, උල තියනවා.

කුජදා TUE - එළිසබෙත් මහ රැජිණගෙ රාජ ප්‍රාප්තියෙන් හැට වන වසර සැමරුම පහුගියදා එංගලන්තය පුරාම පැවැත්වුණා. මොනව වුනත් තවමත් කාගෙන්වත් කැත වචනයක් නාහ ඒ ඇත්ති බ්‍රිතාන්‍ය කිරීටයේ නම්බුව රැකගෙන ඉන්නවා. ඒ නිසාම ඇයට ගෞරව කළ යුතුයි. රැජිණත් එකඅතකට අවාසනාවන්තයි. එයැයිගෙ මනුස්සයා මහා කට කැඩිච්ච කතා කියන්නෙ. පුත්තු තුන්දෙනෙක් ඉන්නවා තඹ සතේක වැඩක් නැහැ. ලොකු පුතා ඉටිරූපෙ වගේ බිරිඳක් අතඇරලා නාකි උලව්වක් ඇහේ ඔතා ගත්තා. හොඳ වෙලාවට මෑන්ට රජකම නොදුන්නෙ. දුන්න නම් අද වෙන කොට මෙහේ රජ පවුලක් නැහැ. රැජිණගෙ දුව ඔහේ ඉන්නවා. මුණුපුරාල දෙන්නගෙන් පොඩි එකා හතරගාතෙන් වැටෙන කල් බොනවා. කාගෙත් නම්බුව බේරෙන්නෙ රැජිණ හින්දා.

බුදදා WED - ගිය සුමානෙ අපි ගෙදර කට්ටිය (පුතයි දුවයි නිහාලුයි මමයි) ඩෙවොන් වල උපන්දින සාදයකට ගියා. ඒක තිබුණේ පරණ ෆිපාම් එකක. පාටිය ජයයි. සුදු අයත් සෑහෙන්න හිටියා. එතන හිටියා අමුතු මෝස් තරයකට ඇඳලා කරේ රතු සළුවකුයි, නවගුණ වැලකුයි දාපු මැදි වයසෙ ලංකාවෙ ගෑණු කෙනෙක්. පාටිය යන අතරෙ එයා මෙන්න එතන හිටපු අයට අත බලලා සාස්තර කියන්න පටන් ගත්තා. ඒ කෙනා සිංහලෙන් කියන දේ තවත් ගෑණු කෙනෙක් ඉංග්‍රීසියට හරවනවා. ඒ දෙන්නම දැනට මාස තුනකට ඉස්සර ඇවිත් තියෙන්නෙ. මගෙත් අත ඉල්ලුවා. මම කිව්වා මගේ අත ගැන මම ඔයාට වැඩිය හොඳට දන්නවා කියලා. ඒපාර තව කෙනෙක් ළඟට ගිහිං අතින් අල්ල ගත්තා. නිහාල්ට ඇහුනලු කියනවා, ලන්ඩන්වල නක්ෂාස්ත්‍ර ඔපිස් එකක් දානව කියලා. එයාට පුළුවන්ලු ඕනම බංකොලොත් වෙච්ච කොම්පැණියක ඒ නරක දසාව දුරුකරලා ආයිත් නගලා ගන්න. ලංකාවෙන් එන්න ඇත්තෙ එහේ සේරම ව්‍යාපාර නග්ගලා දීල වෙන්න ඇති.

බ්‍රහස්පතිදා THU - කැතරින් නැන්දගෙ ලොකු දුව හරි මහතයි. මොන දේ කළත් මහත අඩුවෙන්නෙ නැතිලු. නැන්ද කියනවා කවුද කිව්වලු එක මාසෙන් හිටි ප්‍රමාණෙන් බාගෙට බහින බෙහෙතක් එංගලන්තෙ තියනවයි කියලා. ඒක එවන්නලු. මම කිව්ව කෑම හුහක් අඩුකරන්න කියලා. ඒකත් බැරිලු. ඒ ප්‍රමාණෙම කන ගමන් ඇහත් බහින්න බෙහෙතක්ලු දුව හොයන්නෙ. මට කටට ආව යමක් කියන්න. ඒත් නැන්ද හන්ද කිව්වෙ නැහැ.

සිකුරාදා FRI - ලන්ඩන් වල උදේ වැඩට යන්න ටියුබ් කෝච්චි-යට නැග්ගම මම හැමදාම වගේ දකින දෙයක් තමයි කාන්තාවො සීට් එකේ වාඩිවෙච්ච ගමන් බෑග්එක දිග ඇරලා මේකප් මල්ල ලිහලා පොඩි කණ්ණාඩියකින් බල බල හැඩ වැඩ වෙනවා. මුන් උදේ පරක්කුවෙලා නැගිටපු ඇයො. ඉස්සෙල්ලම නිය පොත්තෙන් ඇස්වල කබ කඩලා, ඩ්‍රයි ක්ලීන් පාරක් දාලයි පටන්ගන්නෙ. ඒ පාර ගැස්සි ගැස්සි යන කෝච්චියෙ හීන් කූරක් අරගෙන ඇහිපිහාටුවල කළු ගානවා. ඇහ හිරි වැටෙනව ඒක දකිනකොට. කෝච්චිය නැවැත්තුවම ගාන්නෙ නෑ. යන කොටයි ගාන්නෙ. ගැස්සෙද්දි ඒ කූර ඇහේ ඇනුණා නම් මොකද වෙන්නෙ. ඇස් දෙක අන්ධ වෙලා ඉඳලා මොකටද? මේ තරුණ ගෑනුන්ට මොළයක් නැද්ද?